## සහස්‍ර අභියෝගතා සංස්ථාව (MCC) සමඟ ඇති කර ගන්නා ගිවිසුමෙහි වැදගත් කරුණු

- ශ්‍රී ලංකා ජනරජය සහ ඇමරිකාවේ සහස්‍ර අභියෝගතා සංස්ථාව (MCC) විසින් ශ්‍රී ලංකාවෙහි ආර්ථික වර්ධනයට ඇති ප්‍රධාන බාධක ලෙස ප්‍රවාහන ක්ෂේත්‍රයේ පවත්නා දුර්වල යටිතල පහසුකම් සහ ඉඩම් පරිපාලන ක්‍රියාවලියෙහි පවත්නා දුර්වලතා හඳුනා ගන්නා ලදි.

- ඉහත කී බාධක වලට විසඳුමක් ලෙස යෝජිත ගිවිසුම මඟින් ප්‍රවාහන සහ ඉඩම් යනුවෙන් ව්‍යාපෘති දෙකක් යෝජනා කරන ලදී. එකී ව්‍යාපෘති දෙකෙහි සම්පූර්ණ වියදම ඩොලර් මිලියන 480කි.

- ඩොලර් මිලියන 350 ක පිරිවැයක් ඇස්තමේන්තු ගත කර ඇති ප්‍රවාහන ව්‍යාපෘතියෙහි ඉදිරි වසර 20 හි දි ප්‍රමාණිත ආර්ථික ප්‍රතිලාභ අනුපාතය 19% වන අතර ඒ මඟින් බස්නාහිර, මධ්‍යම, සබරගමුව සහ ඌව පාලත් වල නගරබඳ සහ පලාත්බඳ ප්‍රවාහන යටිතල පහසුකම්වල කාර්යක්ෂමතාවය සහ ශක්‍යතාවය වැඩි දියුණු කිරීමට බලාපොරොත්තු වේ.

- ප්‍රවාහන ව්‍යාපෘතිය මඟින් අන්තර් මහමාර්ග ජාලය වැඩි දියුණු කිරිමත්, ගමනාගමන පාලන සංඥා පද්ධතිය නවීකරණය කිරීමත් සහ දැනට පවත්නා ප්‍රතිපත්තිමය ව්‍යුහය සහ නියාමන ක්‍රමවේදය ප්‍රතිසංවිධානය කිරිමත් බලාපොරොත්තු වේ.

- ප්‍රවාහන ව්‍යාපෘත්තියට කරනු ලබන ආයෝජනය තුලින් අධික රථවාහන තදබදයට හේතු වී ඇති කරුණු අවම කිරීමටත්, වඩා විශ්වාසදායී පොදු ප්‍රවාහන සේවයක් ලබා දීමටත්, ආකර්ශනශීලි වෙළඳ පොලවල් කරා යන මහජනයාට භාණ්ඩ හුවමාරුවේදී ඇති වන අපහසුතා අවම කිරීමටත්, භාණ්ඩ හුවමාරු විම සඳහා දැරීමට සිදුවන පිරිවැය අවම කර ගැනීමටත් බලාපොරොත්තු වේ.

- ඩොලර් මිලියන 67 ක් වෙන් කර ඇති ඉඩම් ව්‍යාපෘතිය මඟින් ඉදිරි වසර 20 තුළදී 26% කට වඩා වැඩි ආර්ථික ප්‍රතිලාභ අනුපාතයක් බලාපොරොත්තු වන අතර දැනට ශ්‍රී ලංකා රජය ආරම්භ කොට ඇති ඉඩම් පිළිබඳ අවකාශිය දත්ත සහ හිමිකම් පිළිබඳ තොරතුරු ලබා ගැනීමේ වැඩ පිළිවෙල ව්‍යාප්ත කිරිමටත් වැඩි දියුණු කිරිමටත් යොමු වනු ඇත.මෙම ව්‍යාපෘතිය මධ්‍යම, වයඹ, උතුරු මැද සහ නැගෙනහිර පළාත්හි දිස්ත්‍රික්ක මූලික කර ගෙන ආරම්භ කිරීමට බලාපොරොත්තු වේ.

- ඉඩම් ව්‍යාපෘතියෙහි සිදු කිරීමට නියමිත ක්‍රියාකාරකම් මඟින් ශ්‍රී ලංකා රජය සතු රජයේ ඉඩම් ලේඛනගත කර ගැනීමටත්, ඉඩම් තක්සේරු කිරීමේ දැනට පවත්නා ක්‍රමවේදය දියුණු කිරීමටත්, ඉඩම් හිමිකම සම්බන්ධයෙන් කාන්තා අයිතිවාසිකම් තහවුරු කිරීමටත්, ඉඩම් ලියා පදිංචි කිරිමේ කාර්යාලවල පවත්නා ලේඛන, ඔප්පු ඩිජිටල්කරණය කිරීම මඟින් එම ලේඛනයන් විනාශ වීම, සොරකම් කිරීම, ලිපිගොනු නැති වීම වලක්වා ගැනීමටත් අදහස් කෙරේ.

- ඉහත කී ව්‍යාපෘති දෙක මඟින් මිලියන 11.3 ක එනම් ශ්‍රී ලංකාවේ ජනගහනයෙන් 54% ක ප්‍රමාණයකට ප්‍රතිලාභ අත් කර දීමට බලාපොරොත්තු වේ.

- මීට අමතරව ඇමරිකානු ඩොලර් මිලියන 63ක මුදලක් ඉහත කී ප්‍රවාහන සහ ඉඩම් ව්‍යාපෘති සඳහා අවශ්‍ය වන තාක්ෂණික සහාය, ශාක්‍යතා අධ්‍යයන, ව්‍යාපෘති පරිපාලනය, පසුවිපරම් සිදු කිරීම සහ ඇගයීම සඳහා යොදා ගැනීමට නියමිතය. මෙම මුදල ශ්‍රී ලංකා රජයට ව්‍යාපෘතිය කාර්යක්ෂමව සිදුකිරීමටත්, හසුරුවා ගැනීමටත් සහ පසු විපරම් කිරීමටත් උපකාර වනු ඇත.

- මෙම ව්‍යාපෘතිය නිසියාකාරයෙන් ක්‍රියාත්මක කිරීම සඳහා ශ්‍රී ලංකා රජය මඟින් ශ්‍රී ලාංකිකයන්ගෙන් සැදුම් ලත් සේවක මණ්ඩලයකින් සමන්විත ආයතනයක් පිහිටුවනු ලබන අතර ඒ මඟින් ඉහත කී ව්‍යාපෘති වලට අදාල ආමාත්‍යංශ සහ දෙපාර්තමේන්තු අතර සහයෝගයතාවය තුලින් ව්‍යාපෘතියට අදාල ක්‍රියාකාරකම් සිදු කරනු ඇත. ඉහත කී ආයතනය ශ්‍රී ලංකික අධ්‍යක්ෂ මණ්ඩලයට වග කිව යුතු අතර එකී අධ්‍යක්ෂ මණ්ඩලය රාජ්‍ය නිලධාරින් අට දෙනෙකුගෙන් සහ පෞද්ගලික අංශය සහ සිවිල් සමාජය නියෝජනය කරනු ලබන පුද්ගලයන් තිදෙනෙකුගෙන් සමන්විත වනු ඇත.